දූරස්ථ හා අඛණ්ඩ අධ්‍යාපන ඒකකය - රුහුණ විශ්වවිද්‍යාලය
Distance and Continuing Education Unit – University of Ruhuna

ශාස්ත්‍රවේදී සාමාන්‍ය (බාහිර) උපාධි ද්විතීය භාග 2012 පරීක්ෂණය - 2014 දෙසැම්බර්
Bachelor of Arts General (External) Degree Part II 2012 Examination – December 2014

# සිංසා 3.2 - නූතන ප්‍රබන්ධකථා කලාව
# SLG 3.2 - Modern Fiction

කාලය පැය තුන යි

**එක් කොටසකින් ප්‍රශ්න දෙකක්වත් (02) තෝරා ගෙන ප්‍රශ්න පහකට (05) පිළිතුරු සපයන්න.**

---

## I කොටස

01. "නවකථාව මිනිසාගේ නැණ නුවන පාදන, එමෙන් ම සමාජ විඥානය පුළුල් කරන ඥාන මාර්ගයක් ද වෙයි." අද්‍යතන සිංහල නවකථාව සම්බන්ධයෙන් මේ ප්‍රකාශය අර්ථවත් වේ ද යි සාකච්ඡා කරන්න.

02. යටත්විජිත අවධියෙහි ලාංකේය සමාජ සංස්ථාවෙහි විද්‍යමාන වූ දේශපාලනික හා සංස්කෘතික බලවේග තත්කාලීන මිනිසාගේ ජීවිතයට බල පෑ ආකාරය ප්‍රාරම්භක සිංහල ප්‍රබන්ධ ඇසුරින් නිරීක්ෂණය කරන්න.

03. 'ඓතිහාසික නවකථා' (Historical Novels) නම් ශානරය (genre) හඳුන්වාදෙමින් ඩබ්.ඒ. සිල්වාගේ ඓතිහාසික නවකථාවල දැකිය හැකි විශේෂතා සාකච්ඡා කරන්න.

04. සමාජ, ස්ව-අයිතීන් උදෙසා ස්ත්‍රියගේ මැදිහත්වීම මුල්කාලීන සිංහල ප්‍රබන්ධකථාවල නිරූපිත ස්ත්‍රී චරිත ආශ්‍රයෙන් විභාග කරන්න.

05. කෙටිකතා මූලධර්ම අතර දෘෂ්ටි කෝණයෙහි ඇති වැදගත්කම පැහැදිලි කරමින්, කුඩා දරුවකුගේ දෘෂ්ටියෙන් කෙටිකතාවක් නිර්මාණය කිරීමේ දී දැක්විය යුතු විශේෂතා අභිමත නිදසුන් ඇසුරෙන් පරීක්ෂා කරන්න.

## II කොටස

06. "ධනේශ්වර දේශපාලන සංස්කෘතියේ පරිණාමය හා විකාශනය පිළිබඳ සියුම් හරස්කඩක් යුගාන්තය නවකථාවේ නිරූපිත ය." සනිදර්ශන ව සනාථ හෝ නිශ්ප්‍රභ කරන්න.

07. චරිත තුනක් කෘතියෙහි නිරූපිත සනාගේ චරිතය පිළිබඳ විචාර ලිපියක් සම්පාදනය කරන්න.

08. ඊ.එම්. ෆොස්ටර් සහ ඇරිස්ටෝටල් ප්‍රබන්ධකරණය සහ කාව්‍යශාස්ත්‍රය පිළිබඳ ඉදිරිපත් කළ මත උපයෝගී කොටගෙන, කලා කෘතියක ගැටුම නිරූපණය කිරීමේ ලා චරිතවලින් ලැබෙන දායකත්වය නිර්දිෂ්ට කෙටිකතා තුනක්වත් ඇසුරින් සාධනය කරන්න.

09. ස්ත්‍රී පුරුෂ සබැඳියාව නමැති විශ්වීය මනෝභාවය පිළිබඳ ව ඩී.එච්. ලෝරන්ස් දක්වා ඇති චින්තාවන් ලෝමාලිකා කෘතිය ඇසුරින් සාකච්ඡා කරන්න.

(එක් පිළිතුරකට ලකුණු 20 බැගිනි)

❀❀❀❀❀❀❀❀❀❀❀❀❀❀❀❀❀❀❀❀❀❀❀❀❀❀❀❀❀